සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය, 2023, 2024 (2025)
# General Information Technology Examination, 2023, 2024 (2025)

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I, II
General Information Technology I, II

| GIT | S | I, II |
|---|---|---|

පැය තුනයි
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time -10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I

1. පහත උපාංගවලින් පරිගණකයක ප්‍රතිදාන උපාංගයක් පමණක් වන්නේ කුමක්ද ?
   1) යතුරු පුවරුව
   2) මුද්‍රණ යන්ත්‍රය
   3) මූසිකය
   4) ටච් පෑඩ් (touchpad)

2. දත්ත ගබඩා කිරීම සඳහා නෂ්‍ය නොවන (Non – volatile) පරිගණක උපාංගයක් ලෙස භාවිත කරන්නේ පහත සඳහන් උපාංගවලින් කවරක් ද?
   1) කැතෝඩ කිරණ නළය (CRT)
   2) CPU රෙජිස්ටර්ස්
   3) දෘඪ තැටි
   4) RAM

3. පහත ඒවායින් මෘදුකාංගයක් වන්නේ කුමක්ද?
   1) RAM
   2) මූසිකය
   3) මෙහෙයුම් පද්ධතිය
   4) ජාල පරිපාලක

4. පරිගණකයක CPU හි ප්‍රධාන කාර්යය කුමක් ද?
   1) දත්ත ගබඩා කිරීම
   2) චිත්‍රක පෙන්වීම
   3) උපදෙස් ක්‍රියාත්මක කිරීම
   4) අන්තර්ජාලයට සම්බන්ධ කිරීම

5. HTML යන කෙටි යෙදුමෙන් අදහස් කරන්නේ කුමක් ද?
   1) Hyper Text Markup Language
   2) Home Tool Markup Language
   3) Hyperlinks and Text Markup Language
   4) Hyper Tool Markup Language

6. ඕනෑම පරිගණක ජාලයකට සම්බන්ධවීමට පරිගණකයක් භාවිත කරන්නේ පහත සඳහන් උපාංගවලින්/සංරචකවලින් කුමක් ද?
   1) මුද්‍රණ යන්ත්‍රය
   2) සුපිරික්සකය (scanner)
   3) ජාල අතුරුමුහුණත් පත (NIC)
   4) යතුරු පුවරුව

7. පහත ඒවායින් ක්‍රමලේඛන භාෂාවක් වන්නේ කුමක් ද?
   1) Excel
   2) HTML
   3) Pascal
   4) XML

8. මෙහෙයුම් පද්ධතියක මූලික කාර්යය කුමක් ද?
   1) වැඩසටහන් සම්පාදනය (compile) කිරීම
   2) පරිගණක දෘඪාංග සහ මෘදුකාංග කළමනාකරණය කිරීම
   3) වෙබ් අතරික්සු ක්‍රියාත්මක කිරීම
   4) ජාල කළමනාකරණය කිරීම

9. පහත සඳහන් ඒවා අතුරෙන් මෙහෙයුම් පද්ධතියක් වන්නේ කුමක් ද?
   1) Excel
   2) MS Word
   3) Linux
   4) Google Chrome

10. පහත ඒවායින් අන්තර්ජාල අතරික්සුවක් වන්නේ කුමක් ද?
    1) Excel
    2) Python
    3) Linux
    4) Google Chrome

11. පහත ගොනු දිගුවලින් කවරක් ශ්‍රව්‍ය ගොනු (audio files) ආචයනය කිරීම (store) සඳහා භාවිත කරන්නේ ද?
    1) txt    2) mp3    3) docx    4) pdf

12. වෙබ් පිටු නිර්මාණය සඳහා මූලික වන්නේ පහත සඳහන් කුමන භාෂාව ද?
    1) C++    2) Java    3) HTML    4) Python

13. වෙබ් අඩවියකට පිවිසීම සඳහා පරිශීලකයකු භාවිත කරන්නේ, පහත මෘදුකාංග අතුරෙන් කුමන මෘදුකාංගය ද?
    1) වදන් සකසනය
    2) පැතුරුම්පත
    3) වෙබ් අතරික්සුව
    4) දත්ත සමුදාය කළමනාකරණ පද්ධති (DBMS)

14. දත්ත ගුප්ත කේතනයේ (encryption) ප්‍රධාන අරමුණ කුමක් ද?
    1) දත්ත සම්පීඩනය කිරීම (compress)
    2) දත්ත හුවමාරුව වේගවත් කිරීම
    3) දත්ත ආරක්ෂා කිරීම
    4) දත්ත උපස්ථ කිරීම (backup)

15. IP ලිපිනයක මූලික අරමුණ කුමක් ද?
    1) පරිගණක ජාලයක උපාංගයක් හඳුනාගැනීම
    2) අන්තර්ජාලයට සම්බන්ධ වීම
    3) විද්‍යුත් තැපෑලක් යැවීම
    4) යෙදුම් (applications) ධාවනය කිරීම

16. පැතුරුම්පතක සූත්‍රයක් ආරම්භ කිරීමට භාවිත කරනු ලබන පිළිගත හැකි සංකේත මොනවා ද?
    1) # හෝ @
    2) = හෝ +
    3) $ හෝ &
    4) % හෝ *

17. පැතුරුම්පතක කුමන ශ්‍රිතයක්, කෝෂ පරාසයක ඉහළම අගය සොයා ගනී ද?
    1) SUM ()    2) AVERAGE ()    3) MAX ()    4) MIN ()

18. කාලයත් සමග ප්‍රවණතා පෙන්වීමට පැතුරුම්පතක භාවිත කළ හැකි හොඳම ප්‍රස්තාර වර්ගය කුමක් ද?
    1) වට ප්‍රස්තාර (Pie chart)
    2) රේඛා ප්‍රස්තාර (Line chart)
    3) තීරු ප්‍රස්තාරය (Bar chart)
    4) විසිරි තිත් සටහන (Scatter plot chart)

19. පැතුරුම්පතක වලංගු කෝෂ පරාස යොමුවක් වන්නේ පහත සඳහන් කවරක් ද?
    1) A1-A10    2) A1:A10    3) A1;A10    4) A1 A10

20. ජාල සම්බන්ධව 'කලාප පළල' (bandwidth) යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
    1) යම් කාල ඒකකයක් තුළ ජාලයක් හරහා සම්ප්‍රේෂණය කළ හැකි දත්ත ප්‍රමාණය
    2) ජාල කේබලයක භෞතික ප්‍රමාණය
    3) රැහැන් රහිත සංඥාවක සංඛ්‍යාතය
    4) ජාලයකට සම්බන්ධ කර ඇති උපාංග ගණන

21. ගිනි පවුරක (firewall) ප්‍රධාන කාර්යය කුමක් ද?
    1) වෙබ් සේවාදායක කළමනාකරණය කිරීම
    2) ජාලයෙන් පිටතට හා ජාලය තුළට පැමිණෙන දත්ත ප්‍රමාණය (traffic) නිරීක්ෂණය කිරීම
    3) දත්ත සම්පීඩනය කිරීම (data compress)
    4) විද්‍යුත් තැපෑල ආරක්ෂාව වැඩි කිරීම

22. දත්ත සමුදායක ඇති වගුවක ප්‍රාථමික යතුර යනු කුමක් ද?
   1) රෙකෝඩයක් සඳහා අනන්‍ය හඳුනාගැනීමකි
   2) රෙකෝඩයක ක්ෂේත්‍රයක් හඳුනාගැනීමට අනන්‍ය ලේබලයකි
   3) දත්ත ගුප්ත කේතනය (encrypt) සඳහා භාවිත කරන යතුරකි
   4) දත්ත ලබාගැනීමට විධානයකි

23. URL ' http://www.example.com/path ' හි ඇති වසම් නාමය කුමක් ද?
   1) http
   2) www
   3) example
   4) www.example.com

24. වීඩියෝ සංස්කරණ (video editing) සන්දර්භය තුළ 'rendering' යනු කුමක් ද?
   1) වීඩියෝවකට උපසිරැසි එකතු කිරීම
   2) වීඩියෝවක ශබ්දය සීරුමාරු කිරීම
   3) වීඩියෝ ව්‍යාපෘතියක් අවසාන ආකෘතියකට (final format) අපනයනය (exam) කිරීමේ ක්‍රියාවලිය
   4) වීඩියෝ පටයක් කුඩා කොටස්වලට කැපීම

25. පාසලක සිසුන්ගේ විභාග ලකුණුවලට අදාළ දත්ත සහ තොරතුරු පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.
   A – '75, 62, 88, 91' යනු විභාගයක සිසුන්ගේ අමු ලකුණු වේ.
   B - 'පන්තියේ සාමාන්‍ය ලකුණු 79' යනු සාරාංශගත ප්‍රතිඵලයකි.
   C - 'පන්තියේ වැඩිම ලකුණ 91 වේ.'
   D - 'සිසුන් හතරදෙනෙකු විසින් ලබාගත් ලකුණු 55, 75, 65 සහ 85 වේ.'
   ඉහත ප්‍රකාශයන්හි දත්ත සහ තොරතුරු නිවැරදිව වෙන් කර දක්වා ඇති වරණය කුමක් ද?
   1) A සහ D දත්ත වේ; B සහ C තොරතුරු වේ.
   2) A සහ B දත්ත වේ; C සහ D තොරතුරු වේ.
   3) B සහ C දත්ත වේ; A සහ D තොරතුරු වේ.
   4) C සහ D දත්ත වේ; A සහ B තොරතුරු වේ.

26. වීඩියෝ සංස්කරණයේ දී 'cut' යන්නේ අදහස් කරනුයේ කුමක් ද?
   1) ශ්‍රව්‍ය පථයක ශබ්දය වැඩි කිරීම
   2) වීඩියෝ ක්ලිප් එකකට ෆිල්ටරයක් එකතු කිරීම
   3) වීඩියෝ ක්ලිප් එකක් කොටස් දෙකකට බෙදීම
   4) වීඩියෝවක දීප්තිය (brightness) සකස් කිරීම

27. Microsoft PowerPoint හි, 'Slide master' යනු කුමක් ද?
   1) සජීවීකරණ (animations) නිර්මාණය කිරීම සඳහා යොදාගන්නා විශේෂාංගයකි
   2) කදා සඳහා සමස්ත සැලසුම (design) සහ පිරිසැලසුම (layout) සැකසීමට යොදාගන්නා මෙවලමකි
   3) Clipart පුස්තකාලයකි
   4) සංක්‍රාන්ති (transitions) කළමනාකරණය සඳහා යොදාගන්නා විශේෂාංගයකි

28. සමර්පන මෘදුකාංගයක (presentation software) 'Speaker Notes' යනු කුමක් ද?
   1) සභාවට (audience) පෙනෙන සටහන්
   2) කදා මාතෘකා සෑදීම සඳහා මෙවලමක්
   3) සමර්පනය කිරීමේ දී ඉදිරිපත් කරන්නට පමණක් පෙනෙන සටහන්
   4) ශ්‍රව්‍ය පට එකතු කිරීමේ විශේෂාංගයක්

29. සමර්පණ මෘදුකාංගයේ 'Slide Show' හි අරමුණ කුමක්ද?
   1) කදා අන්තර්ගතය සංස්කරණය කිරීම
   2) සැබෑ සමර්පනයේදී දිස්වන පරිදි කදා බැලීම සහ ඉදිරිපත් කිරීම
   3) කදා මුද්‍රණය කිරීම
   4) නිර්මාණ තේමා (design themes) යෙදීම

30. X, Y සහ Z යනු X . Y + (NOT) Z ප්‍රකාශනයේ බූලීයන් විචල්‍ය තුනකි. X, Y සහ Z යන විචල්‍යයන් සඳහා පහත අගය පැවරුම් සලකා බලන්න.

A - (X=0, Y=0, Z=1)
B - (X=1, Y=1, Z=1)
C - (X=0, Y=1, Z=0)
D - (X=1, Y=0, Z=0)

ඉහත අගය පැවරුම්වලින් ප්‍රකාශනය සඳහා 0 අගය ලබාදෙන්නේ කුමක්ද?

1) A පමණි.
2) B පමණි.
3) C පමණි.
4) D පමණි

31. එක්තරා මාර්ගයක, මාර්ග සංඥා පහන් කණු 4ක් එකකට පසු අනෙක හමුවන පරිදි පිහිටා තිබේ. මාර්ග සංඥා කණු අසල 'නැවැත්වීම' හෝ 'නොනැවැත්වීම' පිළිවෙලින් සංඛ්‍යාංක 0 සහ 1 මගින් නිරූපණය කෙරේ. පළමු මාර්ග සංඥා කණුවෙන් ආරම්භ වන මෙම මාර්ග සංඥා හතර හරහා ගමන් කරන වාහනයක රැඳී සිටීමේ කාලය (තත්පර වලින්) ද්විමය අංක 1011 මගින් නිරූපණය කෙරේ.
මෙම වාහනය මාර්ග සංඥා හතරේ ගත කළ මුළු කාලය කොපමණද?

1) තත්පර 7 කි.
2) තත්පර 11 කි.
3) තත්පර 13 කි.
4) තත්පර 15 කි.

32. ASCII හා Unicode කේත ක්‍රම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය නිවැරදි වේද?

1) ASCII යනු Unicode හි උප කුලකයකි.
2) Unicode හා ASCII යනු මුළුමනින්ම වෙනස් වූ කේත ක්‍රම වේ.
3) නවීන යෙදුම් සඳහා වඩා බහුකාර්ය බවක් සමගින් ASCII, Unicode වලට වඩා වැඩි අනුලක්ෂණ (characters) ප්‍රමාණයකට සහාය දක්වයි.
4) අනුලක්ෂණ නිරූපණය කිරීමට, ASCII මෙන්ම Unicode ද එකම බිටු සංඛ්‍යාවක් භාවිත කරයි.

33. පහත සඳහන් ඒවායින් ෂඩ් දශමය සංඛ්‍යාවක් පමණක් වන්නේ කුමක්ද?

1) 1010 2) 256 3) 1A3F 4) 10012

34. තනි බයිටයකින් නිරූපණය කළ හැකි විශාලතම දශමය අගය කුමක්ද?

1) 128 2) 255 3) 256 4) 512

35. පැතුරුම්පතක ඇති කෝෂයකට = 6 / 2 – 2 * 4 / 2 සූත්‍රය ඇතුළත් කළ විට එම කෝෂයේ පහත සඳහන් කුමන අගයක් පෙන්වයිද?

1) 1 2) -1 3) 2 4) -2

36. විශේෂ මෘදුකාංගයක් භාවිත නොකර කිසිවකුට වෙනස් කළ නොහැකි ලෙස විභාග ප්‍රශ්න පත්‍රයක් නිර්මාණය කිරීමට ගුරුවරයෙකුට අවශ්‍ය විය. මෙම විභාග ප්‍රශ්න පත්‍රය ආචයනය සඳහා පහත සඳහන් කුමන ගොනු ආකෘතිය භාවිත කළ යුත්තේ ද?

1) DOC 2) HTML 3) PDF 4) ODT

37. HTML ලේඛන පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.

A – <h1> උසුලනය අධි සන්ධාන සෑදීමට භාවිත කරයි.
B – <style> උසුලනය අභ්‍යන්තර විලාස පත්‍රය (internal style sheet) සෑදීමට භාවිත කරයි.
C – <ol> උසුලනය පටිපාටිගත ලැයිස්තුවක් සෑදීමට භාවිත කරයි.
D – <input type="check"> සලකුණු කොටුවක් (check box) සෑදීමට භාවිත කරයි.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය මොනවා ද?

1) A සහ B පමණි
2) A සහ D පමණි
3) B සහ C පමණි
4) C සහ D පමණි

38. ASCII කේතයෙහි "E" ඉංග්‍රීසි අක්ෂරය දක්වන සංඛ්‍යාවේ දශමය නිරූපණය 69 නම්, "A" ඉංග්‍රීසි අක්ෂරය දක්වන ASCII කේතයට අදාළ සංඛ්‍යාවේ ද්විමය නිරූපණය කුමක්ද?

1) 1000000 2) 1000001 3) 1000011 4) 1000111

ictpastpaper.com

39. පරිගණකවල පහත විශේෂාංග සලකා බලන්න.

A - සකසනයේ වර්ගය, වෙළඳ නාමය සහ වේගය

B - RAM හි ධාරිතාව, වර්ගය සහ වේගය

C - දෘඪ තැටියේ වර්ගය, ධාරිතාව සහ වේගය

D - බැටරි ආයු කාලය

සාමාන්‍ය මේස පරිගණකයක් (desktop) මිල දී ගැනීමේ දී සලකා බැලිය යුතු වන්නේ ඉහත විශේෂාංග වලින් කවරේද?

1) A සහ B පමණි.
2) B සහ C පමණි.
3) C සහ D පමණි.
4) A, B සහ C පමණි.

40. ඊමේල් එකක Bcc (Blind carbon copy) ක්ෂේත්‍රය භාවිත කිරීමේ මූලික අරමුණ කුමක්ද?

1) ඔබට ම ඊමේල් පිටපතක් යැවීමට
2) ලබන්නන්ගේ ලිපින අන් අයට හෙළි නොකර ඊමේල් පිටපත් යැවීමට
3) ඉහළ ප්‍රමුඛතාවයක් ඇති ඊමේල් පිටපතක් යැවීමට
4) ඊමේල් කෙටුම්පතක් සුරැකීමට

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

| GIT | S | I, II |
|---|---|---|

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය, 2023, 2024(2025)
General Information Technology Examination, 2023, 2024(2025)

# සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I, II
# General Information Technology I, II

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණය II

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න

1.

(a) පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට අත්‍යවශ්‍ය පරිගණක මෙහෙයුම් ලියා දක්වන්න. පරිගණකයේ දෘඪ තැටියේ C ධාවකය හැඩසවි (formatted) කර ඇති බව සහ එහි කිසිම දත්තයක් හා ෆෝල්ඩරයක් නොමැති බව උපකල්පනය කරන්න. එමෙන්ම පරිගණකයේ ස්විචය දමා (switched on) ඇති අතර ඔබට එහි desktop මුහුණත සංදර්ශනය වන බව සලකන්න.

(i) දෙන ලද පෞද්ගලික පරිගණකයක C ධාවකයෙහි GIT නමින් ෆෝල්ඩරයක් සෑදීම.

(ii) GIT ෆෝල්ඩරය තුල, examples, docs සහ solutions යන නම්වලින් උප ෆෝල්ඩර 3ක් සෑදීම

(iii) වදන් සකසන මෘදුකාංගයක් භාවිතයෙන් ඔබගේ සුචි අංකය (index number), ඔබගේ නම අඩංගු වදන් සැකසූ ලේඛනයක් සෑදීමට සහ එම ලේඛනය mydata.doc නම් වු ගොනු නාමය සමග ඉහත (ii) කොටසෙහි ඔබ විසින් සාදා ඇති examples ෆෝල්ඩරයේ සුරැකීම.

(iv) ඉහත (iii) කොටසේ ඔබ සෑදු mydata.doc නම් වු ලේඛනය, docs ෆෝල්ඩරය තුල පිටපත් කිරීමට සහ ඉන්පසුව එය myself.doc ලෙස නැවත නම් කිරීම.

(b) දැන්, ඔබ විසින් ඔබේ C ධාවකය හැඩසවි (format) කළහොත් කුමක් සිදුවිය හැකි දැයි යන්න පැහැදිලි කරන්න.

2. විභාගයක දී පන්තියේ සිසුන් ලබාගත් ලකුණු විශ්ලේෂණය කිරීමට පැතුරුම්පතක් නිර්මාණය කරන ලෙස, ඔබේ ICT ගුරුභවතා ඔබෙන් ඉල්ලා ඇතැයි උපකල්පනය කරන්න. ගුරුභවතාගේ අවශ්‍යතා පිළිබඳව ඔබට පහත තොරතුරු ලබා දී ඇත. සෑම සිසුවෙකුම විභාගයේ දී පෙනී සිට ඇත්තේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT), සංඛ්‍යානය (Statistics) සහ තාර්කනය (Logic) යන ප්‍රශ්න පත්‍ර 3 ක් සඳහා පමණි. පන්තියේ ඇත්තේ ළමයින් 5 දෙනෙකු පමණි.

(a) සෑම සිසුවකුගේ ම සුචි අංකය (index number), ප්‍රශ්න පත්‍රවල නම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, සංඛ්‍යානය සහ තර්කනය යන ප්‍රශ්න පත්‍ර තුනට ලබාගත් ලකුණු වෙන වෙන ම ද පැතුරුම්පතෙහි අඩංගු විය යුතු ය.

(b) එක් එක් සිසුවාගේ ප්‍රශ්න පත්‍ර තුනට ම ලබාගත් මුළු ලකුණු (total marks) සහ ඔහු හෝ ඇයගේ සාමාන්‍ය ලකුණු (average marks) ඔවුන්ගේ ප්‍රශ්න පත්‍ර වලට ලැබෙන ලකුණුවලට පසුව තිබෙන තීරු දෙකෙහි ප්‍රදර්ශනය කළ යුතු ය.

(c) සිසුන්ගේ දත්ත ඔවුන්ගේ මුළු ලකුණු මත පදනම්ව, ආරෝහණ පටිපාටියට (ascending order) අනුව පෙන්විය යුතු ය.

(d) එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා සිසුන් ලබාගත් උපරිම ලකුණ (maximum mark) සහ අවම ලකුණ (minimum mark) පැතුරුම්පතෙහි අවසන් සිසුවාගේ දත්තවලට පසුව ප්‍රදර්ශනය කල යුතු ය.

(e) සුචි අංක සහ සිසුන්ගේ මුළු ලකුණු පෙන්වීම සඳහා පැතුරුම්පතට රේඛා ප්‍රස්ථාරයක් (line chart) ඇතුළත් කළ යුතු ය.

ඉහත අවශ්‍යතා මත පදනම්ව, පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) තීරු නම් සහිතව පැතුරුම්පතෙහි දළ සටහනක් අඳින්න.

(ii) ඉහත (b) සහ (d) කොටස්හි ගණනය කිරීම් සඳහා පැතුරුම්පතෙහි ඇතුළත් කල යුතු සූත්‍ර ලබාදෙන්න.

(iii) ඉහත (c) සහ (e) කොටස් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි ලියන්න.

3. පාසලේ ක්‍රීඩා උළෙලට, සිසුන්ගේ දෙමව්පියන්ට ඇරයුම් කිරීම සඳහා ආරාධනා පත්‍රයක් සකස් කිරීමට, වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිත කරන ලෙස ඔබේ පාසල් ගුරුවරයා ඔබෙන් ඉල්ලා සිටියි. ගුරුවරයා ඔබට පහත පිරිසැලසුම (layout) ලබා දී ඇත.

20.03.2025

**<u>Invitation to the Annual School Sports Meet</u>**

Dear Parents,

We are delighted to invite you to our Annual School Sports Meet, which will be held on 02/06/2025 at the school playground from 8.00 am to 4.00 pm.

We would be honored to have you as our guest for this special occasion. Your support and encouragement mean a lot to our students and the entire school community.

You can reach us through our email school@abc.com for any further information or to confirm your participation.

We look forward to welcoming you to our Annual School Sports Meet.

Warm regards,

The principal

ABC school

i. ආරාධනා පත්‍රයේ ඉහත පිරිසැලසුම නිර්මාණය කිරීම සඳහා වදන් සැකසුම් යෙදුමේ විශේෂාංග භාවිත කළ යුතු ද යන්න සහ මෙම විශේෂාංග භාවිත කළ යුත්තේ කුමන ස්ථානවල ද යන්න පැහැදිලි කරන්න.

ii. ආරාධිත දෙමව්පියන්ගේ නම් සහ ලිපින ලැයිස්තුවක් ඔබට ලබා දී ඇත්නම්, ආරාධනා පත්‍රයේ ඇති 'Dear Parents' කොටස එක් එක් දෙමව්පියන්ගේ නම සහ ලිපිනයෙන් ප්‍රතිස්ථාපනය කර එක් එක් ආරාධිතයාට ස්වයංක්‍රීයව ආරාධනා පත්‍රය බැගින් ජනනය කළ හැකි වන්නේ වදන් සැකසුම් යෙදුමේ කුමන අංගය භාවිතය මගින් ද? ඔබ මෙම කාර්යය කරන්නේ කෙසේද?
මේ සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර නම් (field names) සහ ඒවා ආරාධනා පත්‍රයේ පිරිසැලසුමේ පිහිටුවිය යුතු ස්ථාන පෙන්වමින්, ආරාධනා පත්‍රයේ පිරිසැලසුම ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කළ යුතු ය.

4. 'Green Valley High School' හි විදුහල්පතිවරයා වශයෙන් ශිෂ්‍ය තොරතුරු, පන්තිවලට ඇතුළත් කිරීම් සහ ගුරු පැවරුම් ඇතුළු ව පාසලේ දත්ත කළමනාකරණය කිරීමට විශ්වාසදායක සහ කාර්යක්ෂම ක්‍රමයක් මා හට අවශ්‍ය වේ. දැනට, අපගේ දත්ත කළමනාකරණය බොහෝ දුරට අතින් සිදුවන අතර අකාර්යක්ෂමතා, දෝෂ සහ ඉක්මනින් තොරතුරු ලබාගැනීමේ දුෂ්කරතා ඇති කරයි. පරිගණක දත්ත සමුදා පද්ධතියකට මෙම ගැටලු නිරාකරණය කළ හැකි බව මම විශ්වාස කරමි. එවැනි දත්ත සමුදා පද්ධතියක් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද යන්න සහ එහි වාසි, අවාසි හා ක්‍රියාවන් (processes) පිළිබඳ විශේෂ කොට දක්වන වාර්තාවක් මට අවශ්‍ය වේ. ඔබේ වාර්තාවේ පහත සඳහන් කරුණු ද ඇතුළත් කළ යුතු ය.
   (a) දත්ත සමුදායක් යනු කුමක් දැයි පැහැදිලි කරන්න.
   (b) පාසලට දත්ත සමුදා යෙදුමක් අවශ්‍ය වන්නේ මන් දැයි විස්තර කරන්න.
   (c) අදාළ වගු (tables) සහ ක්ෂේත්‍ර (fields) යෝජනා කරන්න.
   (d) යෝජිත වගුවල ප්‍රාථමික යතුරු (primary keys) සහ ආගන්තුක යතුරු (foreign keys) යෝජනා කරන්න.

5. චමත් ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයක තොරතුරු තාක්ෂණය හදාරයි. ඔහුට, සිසුන් සඳහා නොමිලේ බලපත්‍රයක් ලබාදෙන මෘදුකාංග මෙවලමක් භාවිතා කරමින් උපාධි අපේක්ෂක ව්‍යාපෘතියක් කිරීමට අවශ්‍ය වෙයි. මේ සඳහා අදාළ නිල වෙබ් අඩවියේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසු, ප්‍රධාන සේවාදායකය (server) අධිභාර වී ඇති බැවින් (overloaded) මෘදුකාංගය බාගත කිරීම සඳහා ඔහුව ස්වංක්‍රීයව කැඩපත් අඩවියකට (mirror site) හරවා යවනු ලැබේ. කෙසේ වෙතත්, කැඩපත් අඩවිය පූරණය වීමට (loaded) පෙර, මෙම වෙබ් අඩවිය විශ්වාසදායක ඩිජිටල් සහතිකයක් වෙනුවට ස්වයං අත්සන සහිත (self-signed) ඩිජිටල් සහතිකයක් භාවිත කරන බව, ඔහුගේ වෙබ් අතරික්සුව (browser) ඔහුට අනතුරු ඇඟවීමක් නිකුත් කරයි.
   (i) ඩිජිටල් සහතිකයක් යනු කුමක් ද?
   (ii) ස්වයං අත්සන සහිත ඩිජිටල් සහතිකයක් භාවිතා කිරීමේ වාසි දෙකක් හා අවාසි දෙකක් ලියන්න.
   (iii) අනතුරු ඇඟවීම් නොතකා වෙබ් අඩවියට ගොස් අවශ්‍ය මෙවලම බාගත කිරීමට චමත් තීරණය කරයි. ඔබ ඔහු සමඟ එකඟ ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

ICTPastPaper.com

6. පහත රූපසටහන ඔබේ වෙබ් පිටුවක අතරික්සු දසුනක් (browser display) පෙන්වයි.

# Animals

## Dog

Dogs are domesticated mammals, not natural wild animals. They were originally bred from wolves. They have been bred by humans for a long time, and were the first animals ever to be domesticated.

- Family: Canidae
- Lifespan: 10-13 years
- Diet: Omnivore

## Cat

Cats are small, carnivorous mammals that are often kept as pets. They are known for their independence, agility and playful behavior. Domestic cats are highly valued by humans for their companionship and their ability to hunt vermin.

- Family: Felidae
- Lifespan: 12-15 years
- Diet: Carnivore

## Elephant

Elephants are large mammals of the family Elephantidae and the order Proboscidea. They are known for their large ears, tusks made of ivory, and their trunks, which are actually a fusion of their nose and upper lip.

- Family: Elephantidae
- Lifespan: 60-70 years
- Diet: Herbivore


වෙබ් අතරික්සුවේ ඇති තොරතුරු, වෙබ් අතරික්සු දසුනක් ලෙස දැක්වීමට අවශ්‍ය කරන HTML කේතයක් ලියන්න. උපකල්පන ඇත්නම් පැහැදිලිව සඳහන් කරන්න.

7. ‘පරිසර දූෂණය' යන මාතෘකාව යටතේ විද්‍යා තරගය - 2025 සඳහා සමර්පන මෘදුකාංගයක් භාවිතයෙන් සමර්පනයක් සූදානම් කරන ලෙස ඔබේ ගුරුභවතා ඔබෙන් ඉල්ලා සිටී. මෙම සමර්පනය සකස් කිරීම සඳහා ගුරුභවතා ඔබට මාර්ගෝපදේශ ලබා දී ඇත.

කදාව 1: (slide 1) — එය, මාතෘකාව සහ ඉදිරිපත් කරන්නාගේ විස්තරවලින් සමන්විත විය යුතු ය. 'The Environmental Pollution' යනු ඉදිරිපත් කිරීමේ මාතෘකාව වන අතර 'Mr. A. Kumar, ABC School, Matara' ඉදිරිපත් කරන්නාගේ විස්තරයි.

කදාව 2: — එය, පරිසර දූෂණය පිළිබඳ හැඳින්වීමක් ලබා දිය යුතු ය.

කදාව 3: — එය, පරිසර දූෂණයේ ප්‍රධාන ආකාර පහත පරිදි පෙන්විය යුතු ය:




කදාව 4 - 6: — කදාවල දකුණු පසින් රූපයක් (image) පිහිටුවමින් සහ වම් පසින් ඇති ශීර්ෂ පාඨය සමග එක් එක් පරිසර දූෂණ වර්ගය විස්තර කරන්න.

කදාව 7: — පරිසර දූෂණයේ ඓතිහාසික වර්ධනය පෙන්වන ප්‍රස්තාරයක්

තවද, එක් එක් කදාව සඳහා වඩාත් සුදුසු කදා පිරිසැලසුම්, උපසිරැසි භාවිත කිරීමට සහ ප්‍රේක්ෂකයින් ආකර්ෂණය කරගැනීමට සමර්පනය සඳහා අදාළ සජීවිකරණ (animations) සහ සංක්‍රාන්ති (transitions) එක් කරන ලෙස ගුරුභවතා උපදෙස් දෙයි.

පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(a) ඵලදායී සමර්පනයක ඕනෑ ම ලක්ෂණ තුනක් ලැයිස්තුගත කරන්න.

(b) එක් එක් කදාව සඳහා ඔබට තෝරාගත හැකි වඩාත් සුදුසු කදා පිරිසැලසුම ලියන්න.

(c) කදා පිරිසැලසුමක් තේරීමට ඔබ අනුගමනය කළ යුතු පියවර ලියන්න.

(d) කදා 3 දෘශ්‍යමාන කිරීමට (visualize) අදාළ පියවර ලියන්න.

(e) 4 සිට 6 දක්වා කදාවලට රූප (images) ඇතුළු කිරීමේ පියවර ලියන්න.

(f) සජීවිකරණය (animation) සහ සංක්‍රාන්තිය (transition) අතර වෙනස්කම් දෙකක් ලියන්න.